# රණවිරු සේවා අධිකාරිය

## ආරක්ෂක අමාත්‍යාංශය

# කොන්ත්‍රාත් පදනම මත ඇබෑර්තු

**කොන්ත්‍රාත් පදනම මත පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. පද්ධති විශ්ලේෂක - තනතුරු 01

**01. අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව / තොරතුරු තාක්ෂණය පිළිබඳ ප්‍රථම උපාධියක් සමග රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක අවම වසරක සේවා කාලයක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

කළමනාකරණ සහකාර (තාක්ෂණික) කාණ්ඩයේ IT සහකාර II ශ්‍රේණියේ තනතුරක අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**02. රැකියා විස්තරය:**

අධිකාරියේ දත්ත පද්ධතිය නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම.

**03. කොන්ත්‍රාත් දීමනාව:**

[M-1-1] රු. 65,633/- + ජීවන වියදම් දීමනාව

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධානවලට අනුකූලව, මෙම වැටුප් තලයන් 2026.01.01 සිට ක්‍රියාත්මක වේ)

**04. වයස:**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**05. ලිඛිත පරීක්ෂණය:**

අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය:

1. භාෂා කුසලතාව
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. තනතුරට අදාළ විෂය දැනුම

**06. බඳවා ගැනීමේ ක්‍රියාවලිය:**

විස්තීර්ණ ලිඛිත පරීක්ෂණයේ සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සමස්ත ප්‍රතිඵල මත පදනම්ව තනතුර සඳහා වඩාත්ම සුදුසු අයදුම්කරු තෝරා ගනු ලැබේ.

## 02. තොරතුරු තාක්ෂණ සහකාර - තනතුරු 02

**01. අවශ්‍ය සුදුසුකම්:**

(අ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එකොවර සම්මාන සාමාර්ථ 4 ක් (සිංහල/ දෙමළ, ඉංග්‍රීසි භාෂාව සහ ගණිතය ඇතුළත්ව) සහිතව විෂයයන් 6 කින් සමත් වී තිබීම.

(ආ) තෘතීයික අධ්‍යාපනය සඳහා අවශ්‍ය කාර්යසාධන මට්ටමට ළඟාවීම සඳහා අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර අනෙකුත් විෂයයන් සංඛ්‍යාව සමත් වී තිබීම.

**වෘත්තීය සුදුසුකම්:**

අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් තාක්ෂණික පුහුණු ආයතනයකින් පවත්වනු ලබන NVQ 5 මට්ටමට නොඅඩු ඩිප්ලෝමා හෝ සහතික පත්‍ර පාඨමාලාවක් සාර්ථකව නිම කර තිබීම.

**02. රැකියාවේ ස්වභාවය :**

දත්ත පද්ධති නඩත්තු කිරීම සහ මෘදුකාංග යෙදවීම් හා සම්බන්ධ කාර්යයන් ඉටු කිරීම.

**03. කොන්ත්‍රාත් දීමනාව :**

MA-2-1 රු. 46,960/- + ජීවන වියදම් දීමනාව

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2025 හි විධිවිධානවලට අනුකූලව, මෙම වැටුප් තලයන් 2026.01.01 සිට ක්‍රියාත්මක වේ)

**04. වයස :**

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**05. ලිඛිත පරීක්ෂණය :**

අයදුම්කරුවන් පහත සඳහන් විෂයයන් සඳහා වන ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය යුතුය:

1. භාෂා කුසලතාව
2. අභියෝග්‍යතා පරීක්ෂණය
3. තනතුරට අදාළ විෂය දැනුම

**06. බඳවා ගැනීමේ ක්‍රියාවලිය :**

විස්තීර්ණ ලිඛිත පරීක්ෂණයේ සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ සමස්ත ප්‍රතිඵල මත පදනම්ව තනතුර සඳහා වඩාත්ම සුදුසු අයදුම්කරු තෝරා ගනු ලැබේ.

**සියලුම අයදුම්කරුවන් සඳහා :**

- ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
- දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හොඳ කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**සියලුම තනතුරුවල ස්වභාවය :**

මෙම පත්වීම් කොන්ත්‍රාත් පදනම මත සිදු කෙරේ.

**අයදුම්පත් යොමු කිරීම :**

ඉහත තනතුරු සඳහා සුදුසුකම් ලබන අයදුම්කරුවන්, තමන්ගේ සම්පූර්ණ පෞද්ගලික තොරතුරු, අධ්‍යාපනික සහ වෘත්තීය සුදුසුකම්, රැකියා ඉතිහාසය සහ වෙනත් අදාළ තොරතුරු ඇතුළත් විස්තරාත්මක ජීව දත්ත පත්‍රිකාවක් (CV) සමග අදාළ සහතිකවල පිටපත්, ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ දුරකථන අංක සමග 2026.09.24 දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

රජයේ / අර්ධ රාජ්‍ය ආයතනවල සේවකයින්ගේ සියලුම අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.

බහා එවන කවරයේ ඉහළ වම්පස කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය.

**සභාපති,**
**රණවිරු සේවා අධිකාරිය,**
**නො. 449, ගාලු පාර,**
**කොළඹ 03.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED